**සමන්තුරෙයි ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 12 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සමන්තුරෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අයකරනු ලැබූ රු.325,820 ක වෙළඳ බලපත්‍ර ගාස්තු, ආදායමක් ලෙස නොපෙන්වා බැරකම් ලෙස දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වෙන්දේසි කිරීම් මඟින් රු.70,270 කට විකුණනු ලැබූ සහ විනාශ කරන ලද වර්ග 67 කට අයත් කාර්යාල ලීබඩු සහ උපකරණවල පිරිවැය ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි.

### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු විදුලි පරිභෝජන ගාස්තු රු.3,232,958 ක් සහ ලංකා විදුලිබල මණ්ඩලයෙන් අයකර ගත යුතු ලැබීම් රු.3,462,663 ක් ආදිය ගෙවීමට හා අයකර ගැනීමට කටයුතු නොකර වර්ෂ 22 කට අධික කාලයක සිට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල පෙන්වමින් තිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
| --- | --- | --- |
| | රු. | |
| ගොඩනැගිලි | 10,430,029 | |
| මෝටර් රථ හා වාහන | 1,359,230 | ස්ථාවර වත්කම් ලේඛනය |
| ලී බඩු හා සවිකිරීම් | 1,269,343 | |
| නිරවුල් නොකළ අත්තිකාරම් | 581,271 | අත්තිකාරම් ලේඛනය |

**1.3.4 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති යනාදියට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව සතුව 2016 දෙසැම්බර් 31 දිනට රු.2,962,490 ක් වටිනා පරිඝනක, පරිඝනක උපාංග සහ පරිඝනක මෘදුකාංග දක්නට ලැබුණත් ඒවා ලේඛනගත කිරීම සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 104 | 2005 වර්ෂයේදි අතුරුදහන් වූ රු.95,670 ක් වටිනා විදුලි උපකරණ සහ 2015 වර්ෂයේදී අතුරුදහන් වූ රු.35,000 ක් වටිනා කැමරාව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 | මාස 06 ක් ඉක්ම වූ උපලබ්ධි නොවූ රු.2,220 ක් වටිනා චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් සභාව විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක් ඉක්ම වූ රු.2,316,515 ක් වටිනා ඉකුත් තැන්පතු 129 ක් අදාළ පුද්ගලයන්ට ලබාදීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.4,556,592 ක පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,011,557 ක් ව තිබූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,454,965 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 වරිපනම් හා බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ස්ථානවල ඇති ඉඩම් සහ ඉදිකරන ලද නිවාස හා ගොඩනැගිලි මත සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකළ යුතු වූ එකතුව රු.15,268,779 ක වරිපනම් බදුවලින් රු.1,406,851 ක වටිනාකමක් පමණක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගෙන තිබුණි.

### 2.2.2 වෙළඳ බලපත්‍ර ගාස්තු

2016 දෙසැම්බර් 31 දිනට පැවැති ව්‍යාපාර අයිතිකරුවන්ගෙන් අයකළ යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු රු.33,396 ක් වර්ෂ 12 ක කාලයක සිට අයකර ගැනීමකින් තොරව හිඟහිටව පැවතුණි.

### 2.2.3 ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තය සහ 2010 මාර්තු 05 දිනැති අංක 1644 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය ප්‍රකාරව, සභාවේ බල ප්‍රදේශයට අයත් ප්‍රදේශවල පුද්ගලික ආයතන විසින් ස්ථාපිත කළ ප්‍රචාරක දැන්වීම් පුවරු 40 කට අදාළව අයකර ගතයුතු රු.105,550 ක් වටිනා අනුමත කිරීමේ ගාස්තු 2017 සැප්තැම්බර් 25 දින වන විටත් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

### 2.2.4 පොදු වෙළඳපොල කඩ කාමර කුලී අයකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1999 වර්ෂයේ ඉදිකරනු ලැබූ පොදු වෙළඳපොලේ කඩකාමර 84 න් කඩකාමර 8 ක් ඉදිකරනු ලැබූ දින සිට 2016 ජුලි 25 දින දක්වා කිසිඳු කාර්යයක් සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දින වන විට පැවැති පොදු වෙළඳපොල කඩ කාමර හිඟ කුලී රු.1,489,176 ක් වර්ෂ 4 කට අධික කාලයක සිට අයකර ගැනීමකින් තොරව හිඟහිටව පැවතුණි.

(ඇ) විගණනයට ලැබී තිබුණු ලිඛිත ප්‍රකාශයට අනුව, මෙම පොදු වෙළඳපොලට ආසන්නව පැවති පුද්ගලික කඩකාමරවලින් මාසිකව රු.6,000 සිට රු.20,000 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් කුලියට දෙනු ලබන නමුත් සභාවට අයත් මෙම කඩකාමරවලින් නව ලංසු කැඳවීමක් සිදු කිරීමකින් තොරව මාසිකව රු.585 සිට රු.3,335 දක්වා පරාසයක ප්‍රමාණයකින් කුලියට දීම හේතුවෙන් සභාව ආසන්න වශයෙන් රු.2,700,000 ක වටිනාකමක් වාර්ෂිකව අහිමි කරමින් පැවතුණි.

### 2.2.5 මස්කඩ බදු දීම

2016 දෙසැම්බර් 31 දින වන විට පැවැති මස්කඩ බදුකුලී හිඟ රු.5,537,053 ක මුදලින් රු.2,271,293 ක් වර්ෂ දෙකකට අධික කාලයක සිට අයකර ගැනීමකින් තොරව හිඟ හිටව පැවතුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ නගර ශාලාව කුලියට ලබාදීමෙන් අයකර ගත යුතු රු.38,500 ක මුදලක් 2017 සැප්තැම්බර් 25 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයෙන් ගබඩා භාණ්ඩ 68 ක් වෙන්දේසි කිරීම සඳහා ද භාණ්ඩ 21 ක් අළුත්වැඩියා කිරීමටද භාණ්ඩ 21 ක් සහ පුස්තකාල පොත් 912 ක් විනාශ කිරීමට ද නිර්දේශ කර තිබුණත් ඒ සම්බන්ධයෙන් 2017 සැප්තැම්බර් 25 දින වන විටත් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2014 සහ 2015 වර්ෂවලදී ලබාදී තිබූ වටිනාකම රු.57,695,000 ක වාහන 05 ක් සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබුණු සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 10 ක අයිතිය මාරුකිරීම සම්බන්ධයෙන් 2017 සැප්තැම්බර් 25 දින වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට "නව නැගෙනහිර බස් සමාගම" විසින් සභාවට ගෙවිය යුතු ගොඩනැගිලි කුලී රු.113,763 ක් වර්ෂ 03 කට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

(ඉ) ස්ථාන මාරු වී ගිය සහ සේවය හැර ගිය සේවකයින් 08 දෙනෙකුට ප්‍රාදේශීය සභාව විසින් ලබා දී තිබූ රු.55,053 ක හිඟ ණය ශේෂය වර්ෂයක සිට වර්ෂ 04 කට අධික කාලයක් දක්වා අයකර ගෙන නොතිබුණි.

### 3.2 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ දේශීය වැඩසටහන

එක් මාර්ගයක බෝක්කු ඉදිකිරීම සඳහා කියුබික් මීටර 8.76 ක කොන්ක්‍රීට් මිශ්‍රණයක් සහ වර්ග මීටර 50 ක සැටලීම් ලී ද අවශ්‍ය බව ඇස්තමේන්තු කර ඒ අනුව ගෙවීම් ද සිදු කර තිබුණි. කෙසේ වුවද, විගණන පරීක්ෂාවේදී කියුබික් මීටර් 6.01 ක කොන්ක්‍රීට් මිශ්‍රණයක්ද වර්ග මීටර් 34 ක සැටලිම් ලී ද භාවිතා කර තිබුණි. මේ අනුව, සභාව විසින් රු.60,480 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි.

## 4. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමුකළ යුතු කරුණු |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගෙන යාම.<br>(ii) නිෂ්කාර්යව පවතින වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | ආදායම් අයකිරීම් පරිපාලනය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |